ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ශ්‍රී ලංකාවේ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා ඉන්දියාවේ දී දැනුම බෙදා ගැනීමේ සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක්</u>**

ශ්‍රී ලංකාවේ මහාධිකරණ විනිසුරුවරුන් 20 දෙනෙක් 2025 දෙසැම්බර් 15-19 දක්වා භෝපාල් හි ඉන්දීය ජාතික අධිකරණ ඇකඩමියේ පැවති දැනුම බෙදා ගැනීමේ සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් සඳහා සහභාගී වූහ.

2. අධිකරණ තීන්දු ගැනීම සහ අභියාචනා සමාලෝචනය; පූර්ව නඩු විභාග ක්‍රමවේද සහ අභියාචනා ගිවිසුම්; අධිකරණ සහ නඩු කළමනාකරණය; අධිකරණ තුළ තාක්ෂණය භාවිතා කිරීම සහ ඩිජිටල් පරිවර්තනය; සයිබර් අපරාධ සහ විද්‍යුත් සාක්ෂි හැසිරවීම; අධිකරණ නායකත්වය සහ ක්‍රමෝපායික චින්තනය; සුපිළිපන්භාවය, ආචාර ධර්ම සහ වගවීම; වාණිජ බේරුම්කරණය, මැදිහත්කරණය සහ විකල්ප ගැටුම් නිරාකරණ යාන්ත්‍රණ සහ අධිකරණ පීඩනය සහ සුවතාවය ඇතුළු අධිකරණ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වයට අදාළ ප්‍රධාන අංශ ආවරණය කරමින් සැසි නවයක් මෙම වැඩසටහනට ඇතුළත් විය. සංස්කෘතික අන්දැකීම් ලබා දීමේ සහ ඉන්දීය විනිසුරුවරුන් සහ පීඨ සමඟ සුහද තියැලීමක් සඳහා අවස්ථාව ලබා දීමේ අරමුණින් සාංචි වෙත ක්ෂේත්‍ර චාරිකාවක් ද වැඩසටහනට ඇතුළත් විය. මෙම වැඩසටහන ප්‍රතිචාර සහ විගණන සැසියක් සමඟ අවසන් වූ අතර එහිදී සහභාගී වූවන් අනාගතයේදී මෙවැනි වැඩසටහන් නිර්මාණය කිරීමට සහ තවදුරටත් වැඩි දියුණු කිරීමට දායකත්වය ලබා දෙමින් තමන් උගත් ප්‍රධාන කරුණු බෙදා හදා ගත්තේය.

3. මෙම වැඩසටහන ධාරිතා ගොඩනැගීමේ ක්ෂේත්‍රය තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින පුළුල් ද්විපාර්ශ්වික සහයෝගිතා රාමුව යටතේ සංවිධානය කර තිබිණ. මෙම සහයෝගීතාවය ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් මස ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී වාර්ෂිකව ශ්‍රී ලාංකික වෘත්තිකයන් 700 දෙනෙකුට විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා ලබා දෙන බවට සිදු කළ ප්‍රකාශයන් සමඟ තවදුරටත් ශක්තිමත් විය. ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ 2024 දෙසැම්බර් ඉන්දීය සංචාරය අතරතුර ඉන්දියාවේ යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර

අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකාවේ රජයේ නිලධාරීන් 300 දෙනෙකුට ආසන්න ආසන්න පිරිසකට සෑම වසරකම ඉන්දියාවේ පුහුණු අවස්ථා හිමි වේ. සමස්තයක් වශයෙන් ගත් කල ඉන්දියාවේ මෙම ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් හරහා ශ්‍රී ලාංකිකයන් 1000කට පමණ දැනුම හුවමාරු කරගැනීම සහ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථාව හිමි වේ. ඉන්දීය තාක්ෂණ සහ ආර්ථික සහයෝගිතා වැඩසටහන වැනි දැනට පවත්තා වැසටහන්වලට අමතරව මෙම පුහුණු අවස්ථා ලබා දීම විශේෂත්වයකි.

*****

***කොළඹ***
***2025 දෙසැම්බර් 30***